**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2022**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (“කාර්යාංශය”) ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 - විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම්වල බලපෑම් හි 43(අ) ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයේ දී ප්‍රවර්ධන කටයුතු සඳහා දූත මණ්ඩල වෙත ලබා දී තිබූ රු.42,911,308 ක නොපියවූ විදේශ අත්තිකාරම් මත රු.32,782,245 ක විදේශ විනිමය ලාභය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හෝ අදාළ දූත මණ්ඩලවලින් ශේෂ තහවුරු කිරීමක් නොලැබීම සහ ඉහත ශේෂය සඳහා කාර්යාංශයෙන් සවිස්තරාත්මක වයස් විශ්ලේෂණයක් නොලැබීම හේතුවෙන් ඉහත සඳහන් කළ රු.42,911,308 ක් වූ නොපියවූ විදේශ අත්තිකාරම් මුදල විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | අවශ්‍ය විදේශ මුදල් වටිනාකම විදේශ කටයුතු අමාත්‍යාංශයේ (MFA) ශ්‍රී ලංකා රුපියල්වලින් තැන්පත් කරනු ලබන්නේ අදාළ දූත මණ්ඩලයට ප්‍රේෂණය කළ යුතු ගෙවීමේ දිනයේ පවතින විනිමය අනුපාතය අනුව ය. MFA සහ දූත මණ්ඩල දෙකෙහිම ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් බවත්, එබැවින් MFA වෙත තැන්පත් කර ඇති මුදල දූත මණ්ඩලවලට ලැබුණු මුදල ලෙස ගන්නා බවත් ගෙවීමෙන් පසු ඉතිරි මුදල (ඇත්නම්) දූත මණ්ඩල මඟින් ගිණුම් ගත කරන බවත් MFA දැනුම් දී ඇත. | නොපියවූ විදේශ අත්තිකාරම් මත ලැබෙන විදේශ විනිමය හුවමාරු ලාභය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් | 26,178,738 | 28,408,182 | 2,229,444 | 2021 ගිණුම් වලට අනුව SLTDA සහ SLTPB අතර ලැබිය යුතු සහ ගෙවිය යුතු වෙනස රු.44,607,646ක් වූ අතර පාර්ශවයන් අතර නිරන්තර සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂය අවසන් වන විට වෙනස රු.2,229,444 දක්වා අඩු කිරීමට අපට හැකි වී ඇත. වර්ෂය අවසානය වන විට ගිණුම් සමථයකට පත් කිරීමට හැකි වනු ඇත. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.12,457,980 ක් වූ වර්ෂ 06 සිට 11 දක්වා වූ කාලසීමාවක් තිස්සේ හිඟ ණයහිමි ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද නොපියවා තිබුණි. | අවශ්‍ය අනුමැතිය සහ ලියකියවිලි නොලැබීම හේතුවෙන් ගෙවීම්වලට බලපෑමක් සිදු වූ අතර මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර නොපියවූ ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ආ) වර්ෂ 02 සිට 04 දක්වා වූ කාලසීමාවක් තිස්සේ හිඟ හිට තිබූ රු.1,204,283 ක උපචිත වියදම් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද නොපියවා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් වලට අනුව, පසුගිය වසර 2 සිට 4 දක්වා ගෙවිය යුතු රු.3,778,427 ක මුදල 2022 වර්ෂය තුළ රු.1,204,283 ක් දක්වා අඩු කර ඇත . | එම වගකීම් නිරවුල් කර ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 ඡේදයේ 09 වැනි උපවගන්තිය | වර්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරිපත් කළ යුතු වාර්තා, ප්‍රකාශන සහ සැලසුම් වගන්තියට අනුව සෑම වසරකම අවසානයේ සිට මාස තුනක් ඉකුත්වීමට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කාරණය සටහන් කර ඇති අතර අනාගතයේදී අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරනු ඇත. | වර්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, ප්‍රකාශන සහ සැලසුම් සෑම වසරකම අවසානයේ සිට මාස තුනක් ඉකුත්වීමට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ආයතන සංග්‍රහයේ II ඡේදයේ 1.9 වගන්තිය | තනතුරක් ස්ථාපිත කළ දින සිට හෝ ඉන් පසුව හෝ එම තනතුර පුරප්පාඩු ඇති දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම් හෝ පත්වීම් ලබා දිය හැකිය. එසේ වුවද ආයතන සංග්‍රහයට පටහැනිව නිසි අනුමැතියකින් සහ විනිවිදභාවයකින් තොරව 2015 වර්ෂය තුළ කාර්යාංශයේ නිලධාරිනියන් 02 දෙනෙකුට වර්ෂ 09 කට වඩා වැඩි කාලයකට පෙරදාතම කර උසස්වීම් ලබාදී තිබුණි. තවද, උසස්වීම සඳහා වූ අවම වසර 10 ක සේවා කාලය ද මෙම නිලධාරිනියන් විසින් සපුරා නොතිබුණි. | උසස්වීම් සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම තනතුර දැරීමට නියමිත කාලය අවසන් වනතුරු උසස්වීම් ලැබූ තනතුර මත නිලධාරීන් වැඩබලන පදනම මත පත් කර තිබුණි. | තනතුරක් ස්ථාපිත කළ දින සිට හෝ ඉන් පසුව හෝ තනතුර පුරප්පාඩු වී ඇති දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම් හෝ පත්වීම් සිදු කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොත<br>i) 2.3 ඡේදය | සියලුම රජය සතු ව්‍යවසායන් විසින් මෙම අත්පොතෙහි අදාළ විධිවිධානවලට අනුකූලව වෙන් වූ පරිපාලන සහ මූල්‍ය අත්පොත් සම්මත කර ගැනීමට අවශ්‍ය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, මේ දක්වා කාර්යාංශය විසින් පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අනුමත කර නොතිබුණි. | කාර්යාංශය ආයතන සංග්‍රහය සහ මූල්‍ය රෙගුලාසි අනුගමනය කරයි. තවද කාර්යාංශය රාජ්‍ය ව්‍යවසාය සඳහා අදාළ වන චක්‍රලේඛ අනුගමනය කරයි. ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ පරිපාලන කටයුතු සඳහා භාවිතා කිරීම කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | මෙම අත්පොතෙහි අදාළ විධිවිධානවලට අනුකූලව වෙනම පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. |
| ii) 3.2 ඡේදය (i) | ආයතනයේ ප්‍රවාහන දීමනාව ලෙස ගෙවනු ලබන රු.4000 ක දීමනාවට අමතරව රු.6000 ක අමතර දීමනාවක් 2022 ඔක්තෝබර් 01 දින සිට සේවකයින් 69 දෙනෙකුට රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය ඇතිව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට අමතර දීමනාවක් ලෙස ගෙවූ මුදල රු. 1,197,600 ක් විය. | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 15.2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව සංචාරක අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව එකී ගෙවීම් සිදු කෙරේ. | රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| iii) ඡේදය 3.4 (x) | සෑම රජය සතු ව්‍යවසායකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කාර්යාංශය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | කාර්යාංශය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කරයි. ඒ අනුව කාර්යාංශය ශ්‍රේණිගත උසස්වීම් සහ අභ්‍යන්තර උසස්වීම් ප්‍රදානය කරයි. එබැවින් අනුප්‍රාප්තික සැලසුම්කරණය රඳා පවතින්නේ සුදුසුකම් සපුරා ඇති සහ අනුමත බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි අනුව ඊළඟ උසස්වීම් ශ්‍රේණි හෝ තනතුරු සඳහා සුදුසුකම් ලබන අය මත ය. | අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,094,939,345 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,644,467,520 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,450,471,825ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අපගමන බදු ආදායම රු. 1,369 , 464, 349 කින් වැඩි වීම, සංචාරක සංවර්ධන බද්ද රු. 199,989,695 කින් වැඩි වීම සහ ආයෝජන මත පොලී ආදායම රු. 572,959,702 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය, ස්කැන්ඩිනේවියාව, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, චෙක් ජනරජය, ජපානය, ඇමරිකාව, කැනඩාව, තුර්කිය, සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව හා පිලිපීනය යන රටවල පැවැත්වීමට සැලසුම් කර තිබූ ප්‍රවර්ධන කටයුතු කිසිවක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | ඔබ දන්නා පරිදි, කාර්යාංශයේ ක්‍රියාකාරකම් සඳහා ගෝලීය කොවිඩ් තත්ත්වය, රට තුළ පැවති මූල්‍ය අර්බුදය සහ රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් බාධා ඇති විය. ඒ අනුව, කාර්යාංශයේ ප්‍රවර්ධන කටයුතු සීමා කිරීමට සිදු විය. | ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ආකර්ෂණය කර ගැනීම සඳහා සැලසුම් කළ පරිදි ප්‍රවර්ධන කටයුතු පැවැත්විය යුතුය. |
| (ආ) කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මැයි 09 සිට 12 දක්වා අරාබි සංචාරක වෙළඳපොළ (ATM-2022) සඳහා සහභාගී වීමට 2021 දෙසැම්බර් 17 වන දින රු.90,000,000 ක් අනුමත කර තිබූ අතර පසුව මෙම පිරිවැය රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් කාර්යාංශයේ සභාපතිවරයා විසින් 2022 මාර්තු 29 දින රු.120,464,910 දක්වා වැඩි කර තිබුණි. වර්ග මීටර් 250ක ඉඩ ප්‍රමාණය වෙන්කර ගැනීමට ලංසු කැඳවූ නමුත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එම ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 150 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, අවකාශය අඩු වීම පිරිවැය අඩු වීමට බලපා නොතිබූ අතර එහි මූලික පිරිවැය ඇ.ඩොලර් 16,175 කින් වැඩි වී තිබුණි. මීට අමතරව රිබන්, කතුරු, ඉටිපන්දම් සහ බන්දේසි සඳහා ඇ.ඩොලර් 525ක් සහ ඇ.ඩොලර් 2,444.55ක් වැට් බදු අය කර තිබුණි. එබැවින් 2021 දෙසැම්බර් මාසයේදී මෙම තීරණය ගනු ලැබුවද කාර්යාංශය විසින් උත්සවය නිසි ලෙස සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | වෙනත් ලංසුකරුවන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අඩු කේවල් කිරීමේ හැකියාව, කාලය සීමාසහිත වීම සහ ඒ වන විට ලබා ගත නොහැකි වූ කොන්දේසි සහිතව පිළිගැනීමට සිදු වීම හේතුවෙන්, කාර්යාංශය හට විකල්පයක් නොතිබුණි. | අනාගතයේදී එවැනි පාඩු වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බල බෝට්ටු සංගමය විසින් 2017 වර්ෂයේදී සංවිධානය කරන ලද බෙන්තොට ප්‍රදේශයේ පැවති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ජාත්‍යන්තර බල බෝට්ටු තරඟයකට ශ්‍රී ලංකා | මෙම තරඟය පසුව 2017 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර එය එවකට සංචාරක අමාත්‍යවරයා සහ එවකට ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි පවත්වන ලදී. ප්‍රවර්ධන | සෑම මිලදී ගැනීමකදීම හෝ සේවා ලබා ගැනීමේදීම ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු අතර ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට බැඳීමක් ඇති කර |

| | | |
|---|---|---|
| සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී වී තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව රු.7,600,000 ක දායකත්වයක් ලබා දීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, මෙහිදී සමස්ත පිරිවැයෙන් සියයට 20ක් සඳහා සංගමය විසින් බැංකු ඇපකරයක් සපයා නොතිබීම, බොහෝ ප්‍රවර්ධන කටයුතු සංගමය විසින් ඉටුකර නොතිබීම, එකඟ වූ පිරිවැය රු.3,172,859 කින් හෝ සියයට 42කින් වැඩිකර තිබීම, එංගලන්තයේ සිට බල බෝට්ටු ප්‍රවාහනය සඳහා නැව් සමාගමක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම, බල බෝට්ටු තරඟය පැවැත්වීමේ ප්‍රමාදයක් සිදු වීම සහ බෝට්ටු නැවට යොමු කිරීමේ ප්‍රමාදයක් ද සිදු වී තිබුණි.. | ක්‍රියාකාරකම්වල ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සංවිධායකවරයාගෙන් ලැබී නොමැත. නැව් සමාගම තෝරාගෙන දැනුම් දෙනු ලැබුවේ ලංකා නැව් සංස්ථාව විසිනි. සංවිධායකවරයා එංගලන්තයේ නැව් සමාගම සහ ශ්‍රී ලංකාවේ නියෝජිත සමාගම යන දෙකෙහිම කළමනාකාර අධ්‍යක්ෂවරයා බව අවසාන ගෙවීම් අදියරේදී හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, එවකට අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා ලබාදුන් උපදෙස් අනුව අවසන් ගෙවීම සිදු කරන ලදී. | ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 21 වන දින දකුණු ආසියාවේ සංචාරක සහ සංචාරක හුවමාරුවේ (SATTE 2022) සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද, 2022 මැයි 09 දින දක්වා ඒ සඳහා කුටි සැලසුම් සහ ඉදිකිරීම් සමාගමක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමට කටයුතු කර නොතිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව මුල් ඇස්තමේන්තු වටිනාකම රු.7,000,000 ඉක්මවා රු.11,357,500 ක් වූ පිරිවැයකට නිශ්චිතව නම් කරන ලද සංවිධායකවරයෙකු හරහා කුළුන(stand) නිර්මාණය කිරීම සහ ඉදිකිරීම සඳහා සේවා ලබා ගැනීම සඳහා 2022 අප්‍රේල් 20 දිනැති අංක 01/27/2021 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. | ඒ වනවිට පැවති අවිනිශ්චිතභාවය හේතුවෙන් මෙම අවස්ථාවට සහභාගී වීමට තීරණය කර ඇත්තේ අවසන් මොහොතේය. එබැවින්, කාලය සීමිත වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් උත්සවය සඳහා කුළුන (stand) ගොඩනැගීම සඳහා නිල සංවිධායකවරයාගෙන් සේවාවන් ලබා ගෙන ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීමට පියවර ගත යුතුය. |

.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්), අධ්‍යක්ෂ (නව නිර්මාණ සංවර්ධන), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), සහකාර අධ්‍යක්ෂ (අලෙවිකරණ), සහකාර අධ්‍යක්ෂ (SPR), සහකාර අධ්‍යක්ෂ (මුදල්), අභ්‍යන්තර විගණක සහ කනිෂ්ඨ කළමනාකරුවන්11ක තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි., . | අවශ්‍ය සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය 2022 දී අනුමත කරන ලදී. එබැවින් අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්පත් 2023 දී කැඳවන ලද අතර පළමු සම්මුඛ පරීක්ෂණය 2023 මැයි 12 දින පැවැත්වීමට නියමිතය. තනතුරු ජ්‍යෙෂ්ඨත්වය අනුව පුරවනු ලැබේ. | පුරප්පාඩු වූ තනතුරු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2010 පෙබරවාරි 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යාංශයේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් කාර්යාංශයට බඳවාගෙන ඇති අවස්ථා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | බඳවා ගැනීමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූලව සුදුසුකම් අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් සලකා බලනු ලැබේ. 2009 දී අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සලකා බලා ඇති සුදුසුකම්වලට අනුකූලව නිලධාරීන්ට සුදුසුකම් තිබේ නම් බඳවා ගැනීම් සිදු කර ඇත. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ පරිපාටියෙහි දක්වා ඇති සුදුසුකම්වලට ඍජුව නොගැලපෙන බඳවා ගැනීම් මෑතදී සිදු කර නොමැත. | සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් අනුමත බඳවා ගැනීමේ පරිපාටි වලට අනුකූල විය යුතුය . |